## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 09

## සෞඛ්‍ය විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය -2021

# ඇගයීම් වාර්තාව

# **09 - සෞඛ්‍ය විද්‍යාව**

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින් වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරුන් ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ 2021(2022) සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
පිරිවෙන් සාමාන්‍ය පෙළ සෞඛ්‍ය විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය , I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද I ප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024 ජූලි 31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායක හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවීව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය හා විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහිකරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | බී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| සංස්කරණය | : | මංගලිකා වීරසිංහ මෙය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>155/5, දොලලන්දවත්ත, තලවතුගොඩ<br><br>ඩී.එන් කොඩිතුවක්කු මයා<br>අධ්‍යක්ෂක,<br>ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| ලේඛක මණ්ඩලය | : | මංගලිකා වීරසිංහ මෙය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>155/5, දොලලන්දවත්ත, තලවතුගොඩ<br><br>ටී. පාලිත මයා<br>පරිවේණාචාර්ය (විශ්‍රාමික)<br>නො. 38 රත්මහර ජනපදය, අලුත්වල<br><br>බී. ඒ. ඩබ්. පී විමලසේන මයා<br>පරිවේණාචාර්ය<br>සමග්ගෝදය පිරිවෙන, හෙම්මාතගම |
| පරිගණක පිටපත සැකසුම | : | ආර්.ඒ.එන්.එම් පෙරේරා<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ඒ. එල්. කේ චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාර |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | i |
| පෙරවදන | ii |
| පටුන | iv |
| වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය | v |
| **1.** සෞඛ්‍ය විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු | **01** |
| 1.1. සෞඛ්‍ය විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු | 01 |
| 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමක තොරතුරු | 02 |
| **I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | **05** |
| **2. I** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | **06** |
| 2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 06 |
| 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 07 |
| 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය | 13 |
| 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 16 |
| 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා | 18 |
| **II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | **19** |
| **3. II** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | **20** |
| 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 20 |
| 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 21 |
| 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 21 |
| 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය | 22 |
| 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 23 |
| 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන | 43 |
| **4.** පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් අවධානය යොමුකළ යුතු කරුණු | **44** |
| **5.** ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා | **45** |

## වගු නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2 |
| වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 2 |
| වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව | 3 |
| වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව | 4 |
| වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 12 |
| වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 14 |
| වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක | 15 |
| වගුව 2.4 තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව | 17 |


## ප්‍රස්තාර නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 13 |
| ප්‍රස්තාරය 2.2 I පත්‍රයේ තේමා අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය | 16 |
| ප්‍රස්තාරය 2.3 I පත්‍රය - තේමා අනුව පහසුතාව හා ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 17 |
| ප්‍රස්තාරය 3.1 II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 21 |
| ප්‍රස්තාරය 3.2 II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 21 |
| ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/ අනුකොටස්වල පහසුතා දර්ශකය | 22 |
| ප්‍රස්තාරය 3.4 (a) 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 26 |
| ප්‍රස්තාරය 3.4 (b) 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 26 |
| ප්‍රස්තාරය 3.5 (a) 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 28 |
| ප්‍රස්තාරය 3.5 (b) 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 28 |
| ප්‍රස්තාරය 3.6 (a) 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 31 |
| ප්‍රස්තාරය 3.6 (b) 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 31 |
| ප්‍රස්තාරය 3.7 (a) 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 33 |
| ප්‍රස්තාරය 3.7 (b) 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 33 |
| ප්‍රස්තාරය 3.8 (a) 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 35 |
| ප්‍රස්තාරය 3.8 (b) 5 ප්‍රශ්නයෙහි කොටස්වල හා අනුකොටස්වල පහසුතාවය | 35 |
| ප්‍රස්තාරය 3.9 (a) 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 37 |
| ප්‍රස්තාරය 3.9 (b) 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 37 |
| ප්‍රස්තාරය 3.10 (a) 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 39 |
| ප්‍රස්තාරය 3.10 (b) 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 39 |
| ප්‍රස්තාරය 3.11 (a) 8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 42 |
| ප්‍රස්තාරය 3.11 (b) 8 ප්‍රශ්නයෙහි කොටස්වල හා අනුකොටස්වල පහසුතාවය | 42 |
| ප්‍රස්තාරය 3.12 එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 43 |

# 1. සෞඛ්‍ය විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1. සෞඛ්‍ය විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු

1. පෞද්ගලික හා සමාජීය සෞඛ්‍ය ප්‍රවර්ධනය මගින් සෞඛ්‍යවත් සමාජයක් ගොඩ නැගීමට දායක වීම.
2. සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා සුදුසු ආහාර පරිභෝජනයට යොමු කිරීම.
3. ජීවිතයේ යහපැවැත්ම සඳහා ජලය සුරක්ෂිතව පරිහරණය කිරීමට හුරු කිරීම.
4. පද්ධති සෞඛ්‍යවත්ව පවත්වා ගැනීමට කටයුතු කිරීම.
5. බෝ වන හා බෝ නොවන රෝගවලින් ආරක්ෂා වීමට මගපෙන්වීම.
6. අවශ්‍ය අවස්ථාවලදී ප්‍රථමාධාර ලබාදීමේ කුසලතාව සංවර්ධනයට පදනමක් සැපයීම.
7. බුදු දහම හා සෞඛ්‍ය විද්‍යාව අතර සම්බන්ධතාව පෙන්වා දීම.
8. මානසික සෞඛ්‍යය රැක ගැනීම සඳහා වූ ක්‍රමවේද ප්‍රගුණ කිරීමට යොමුකරවීම.
9. ආයුර්වේදය හා සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමවල වැදගත්කම පෙන්වාදීම.
10. සෞඛ්‍ය සංරක්ෂණය සඳහා ප්‍රතිශක්තිකරණයේ අවශ්‍යතාව උද්දීපනය කිරීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

වගුව1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 1820 | 17 | 1837 |
| ඉංග්‍රීසි | 12 | 0 | 12 |
| දෙමළ | **0** | **0** | **0** |
| **එකතුව** | **1832** | **17** | **1849** |

වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 242 | 13.21 | 3 | 17.65 | 245 | 13.25 |
| B | 382 | 20.85 | 5 | 29.41 | 387 | 20.93 |
| C | 631 | 34.44 | 6 | 35.30 | 637 | 34.45 |
| S | 397 | 21.67 | 2 | 11.76 | 399 | 21.58 |
| W | 180 | 9.83 | 1 | 5.88 | 181 | 9.79 |
| එකතුව | **1832** | **100.00** | **17** | **100.00** | 1849 | **100.00** |

**වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන (B) සාමාර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 125 | 19 | 15.20 | 32 | 25.60 | 44 | 35.20 | 19 | 15.20 | 114 | 91.20 | 11 | 8.80 |
| ගම්පහ | 166 | 25 | 15.06 | 45 | 27.11 | 47 | 28.31 | 29 | 17.47 | 146 | 87.95 | 20 | 12.05 |
| කළුතර | 151 | 31 | 20.53 | 32 | 21.19 | 44 | 29.14 | 32 | 21.19 | 139 | 92.05 | 12 | 7.95 |
| මහනුවර | 188 | 54 | 28.72 | 44 | 23.40 | 44 | 23.40 | 37 | 19.68 | 179 | 95.21 | 9 | 4.79 |
| මාතලේ | 71 | 6 | 8.45 | 15 | 21.13 | 31 | 43.66 | 11 | 15.49 | 63 | 88.73 | 8 | 11.27 |
| නුවරඑළිය | 20 | 5 | 25.00 | 7 | 35.00 | 6 | 30.00 | 1 | 5.00 | 19 | 95.00 | 1 | 5.00 |
| ගාල්ල | 148 | 23 | 15.54 | 24 | 16.22 | 48 | 32.43 | 37 | 25.00 | 132 | 89.19 | 16 | 10.81 |
| මාතර | 136 | 15 | 11.03 | 32 | 23.53 | 59 | 43.38 | 26 | 19.12 | 132 | 97.06 | 4 | 2.94 |
| හම්බන්තොට | 96 | 12 | 12.50 | 31 | 32.29 | 32 | 33.33 | 14 | 14.58 | 89 | 92.71 | 7 | 7.29 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 35 | 6 | 17.14 | 4 | 11.43 | 17 | 48.57 | 5 | 14.29 | 32 | 91.43 | 3 | 8.57 |
| ත්‍රිකුණාමලය | 10 | 1 | 10.00 | 0 | 0.00 | 6 | 60.00 | 3 | 30.00 | 10 | 100.00 | 0 | 0.00 |
| කුරුණෑගල | 169 | 11 | 6.51 | 35 | 20.71 | 62 | 36.69 | 39 | 23.08 | 147 | 86.98 | 22 | 13.02 |
| පුත්තලම | 41 | 0 | 0.00 | 7 | 17.07 | 13 | 31.71 | 18 | 43.90 | 38 | 92.68 | 3 | 7.32 |
| අනුරාධපුර | 99 | 3 | 3.03 | 14 | 14.14 | 27 | 27.27 | 33 | 33.33 | 77 | 77.78 | 22 | 22.22 |
| පොළොන්නරුව | 47 | 1 | 2.13 | 6 | 12.77 | 19 | 40.43 | 15 | 31.91 | 41 | 87.23 | 6 | 12.77 |
| බදුල්ල | 96 | 9 | 9.38 | 11 | 11.46 | 35 | 36.46 | 26 | 27.08 | 81 | 84.38 | 15 | 15.63 |
| මොණරාගල | 58 | 8 | 13.79 | 13 | 22.41 | 19 | 32.76 | 12 | 20.69 | 52 | 89.66 | 6 | 10.34 |
| රත්නපුර | 111 | 11 | 9.91 | 25 | 22.52 | 43 | 38.74 | 24 | 21.62 | 103 | 92.79 | 8 | 7.21 |
| කෑගල්ල | 81 | 5 | 6.17 | 10 | 12.35 | 41 | 50.62 | 17 | 20.99 | 73 | 90.12 | 8 | 9.88 |
| සමස්ත ප්‍රතිඵලය | 1,849 | 245 | 13.25 | 387 | 20.93 | 637 | 34.45 | 399 | 21.58 | 1,668 | 90.21 | 181 | 9.79 |

**වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 7 | 0.38 | 1849 | 100.00 |
| 81 - 90 | 91 | 4.92 | 1842 | 99.62 |
| 71 - 80 | 289 | 15.63 | 1751 | 94.70 |
| 61 - 70 | 408 | 22.07 | 1462 | 79.07 |
| 51 - 60 | 432 | 23.36 | 1052 | 57.00 |
| 41 - 50 | 305 | 16.50 | 622 | 33.64 |
| 31 - 40 | 188 | 10.17 | 317 | 17.14 |
| 21 - 30 | 90 | 4.87 | 129 | 6.98 |
| 11 - 20 | 33 | 1.78 | 39 | 2.11 |
| 01 - 10 | 6 | 0.32 | 6 | 0.32 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුවෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා**:** 31-40 පන්ති ප්‍රාන්තරය සැලකීමේ දී,

සෞඛ්‍ය විද්‍යාව විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 1849 අතුරෙන් 31-40 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 188කි. එය ප්‍රතිශතයක් වශයෙන් 10.17%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 317ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 17.14%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

**කාලය : පැය 01 යි.**

**වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.**


**එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**
**ලකුණු එකතුව 1 x 40 ලකුණු 40යි.**

## 2.2 I ප්‍රශ්න පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. කිසියම් සංකල්පයක් විස්තර කිරීම සඳහා ශිෂ්‍ය හිමිනමක් පහත රූපයේ දැක්වෙන සටහන භාවිත කරන ලදී.




ඉහත රූප සටහනෙන් විස්තර කෙරෙන සංකල්පය

(1) සෞඛ්‍ය ප්‍රවර්ධනය වේ. (2) පූර්ණ පෞරුෂය වේ.
(3) පූර්ණ සෞඛ්‍යය වේ. (4) යහජීවනය වේ.

2. සුචරිත දහම් පාසලේ නායක ස්වාමීන් වහන්සේ විසින් සිසුන්ට සෞඛ්‍ය සායන පැවැත්වීම හා උපදේශන සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය අවස්ථා සලසන ලදහ. සෞඛ්‍ය ප්‍රවර්ධන ක්ෂේත්‍ර යටතේ, නායක ස්වාමීන් වහන්සේ විසින් ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් කාර්යය අයත්වන ක්ෂේත්‍රය කුමක් ද?

(1) සෞඛ්‍යවත් ප්‍රතිපත්ති සැකසීම
(2) සෞඛ්‍යවත් පරිසරයක් සැකසීම
(3) සෞඛ්‍යය දියුණුව සඳහා ප්‍රජා සහභාගිත්වය
(4) සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 3 සහ 4 ට පිළිතුරු සපයන්න.
පුද්ගලයකුගේ BMI අගය එම පුද්ගලයාගේ වයසට එදිරිව සුදුසු ප්‍රස්තාරයේ ලකුණු කළවිට එම ලක්ෂය පිහිටන කලාපයේ වර්ණය අනුව එම පුද්ගලයාගේ පෝෂණ මට්ටම තීරණය කළ හැකි ය.

3. සරණ හිමිගේ BMI අගය උන්වහන්සේගේ වයසට එදිරිව ලකුණු කළ විට එම ලක්ෂය කොළපාට වර්ණ පරාසයේ සටහන් වූයේ නම්, සරණ හිමි

(1) උසට සරිලන බරකින් යුක්ත ය. (2) අධිබරකින් යුක්ත ය.
(3) කෘශභාවයෙන් යුක්ත ය. (4) ස්ථුලතාවයෙන් පෙළෙයි.

4. රාහුල හිමිගේ BMI අගය වයසට එදිරිව ලකුණු කළ විට එම ලක්ෂය ලාදම් පාට වර්ණ පරාසයේ පිහිටියේ නම් ඉන් නිගමනය කළ හැක්කේ රාහුල හිමි

(1) නිසි කායික යහපැවැත්මකින් යුක්ත බව ය.
(2) කෘශභාවයෙන් යුක්ත බව ය.
(3) ස්ථුලතාවෙන් යුක්ත බව ය.
(4) අධි බරකින් යුක්ත බව ය.

5. සෞඛ්‍යවත් පිරිවෙන් පරිසරයක් තුළ දක්නට නොමැති ලක්ෂණයක් නම්,
   (1) සතුටින් වාසය කිරීමට ඉඩ ප්‍රස්ථාව තිබීම.
   (2) ආදරය හා ආරක්ෂාව ලබාදීමට කටයුතු කිරීම.
   (3) යහපත් අන්තර් පුද්ගල සබඳතා වර්ධනයට අවස්ථාව සීමිත වීම.
   (4) අධ්‍යාපන කටයුතුවල යෙදීමට පහසුකම් තිබීම.

6. ශිෂ්‍ය භික්ෂුන් වහන්සේ නමකට පිරිවෙන තුළ සුරක්ෂිතතාව නැතිවීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් වන්නේ,
   (1) සමාජ පිළිගැනුමට ලක්වීම.
   (2) ගුරු හාමුදුරුවන් සමග ඇති ගෞරවනීය සබඳතාව වැඩි වීම.
   (3) යහපත් ගතිගුණ සහ පුරුදු ඇති වීම.
   (4) ඉගෙනීමට කැමැත්ත අඩු වීම.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **7** සහ **8** ට පිළිතුරු සපයන්න.

නන්ද භික්ෂුන් වහන්සේගේ සිරුරෙහි ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. උන්වහන්සේ ස්වාධීනව කටයුතු කිරීමට මෙන්ම සමාජශීලීවීමට ද කැමැත්තක් දක්වයි.

7. ඉහත විස්තරයේ සඳහන් ගුණාංග අනුව නන්ද භික්ෂුන්වහන්සේ අයත්වන ජීවන අවධිය කුමක් ද?
   (1) පසු ළමා විය (2) නව යොවුන් විය (3) තරුණ විය (4) මැදි විය

8. නන්ද හිමි ස්වාධීනව කටයුතු කිරීමට කැමැත්තක් දැක්වීමෙන් නිගමනය කළ හැක්කේ උන් වහන්සේ,
   (1) කායික ක්ෂේත්‍රයේ සංවර්ධනය වී ඇති බව ය.
   (2) මානසික ක්ෂේත්‍රයේ සංවර්ධනය වී ඇති බව ය.
   (3) සාමාජයීය ක්ෂේත්‍රයේ සංවර්ධනය වී ඇති බව ය.
   (4) අධ්‍යාත්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය වී ඇති බව ය.

9. භික්ෂුන් වහන්සේලා තම දානවේල පරිභෝජනයේදී නොකළ යුතු ක්‍රියාවක් වන්නේ,
   (1) බදින ලද හෝ අධික තෙල් සහිත ආහාර තෝරාගැනීම සීමා කිරීම ය.
   (2) සීනි අධික ආහාර පුරුද්දක් ලෙස පරිභෝජනයෙන් වැළකීම ය.
   (3) හැකි සෑම අවස්ථාවකදීම මිශ්‍ර ආහාර පරිභෝජනයට යොමුවීම ය.
   (4) දානය වළඳා නිම වූ වහාම තේ, කෝපි යනාදිය පානය කිරීම ය.

10. භික්ෂුන් වහන්සේලා විසින් තම දානවේල සකසා ගත යුතු අවස්ථාවක පරිභෝජනය සඳහා නුසුදුසු ආහාර ලෙස සැලකෙන්නේ,
   (1) නැවුම් බවකින් යුත් ආහාර වර්ග ය.
   (2) ඇසුරුම තැළී, පොඩි වී, පළඳු වී නොමැති ආහාර ය.
   (3) නිෂ්පාදන දිනය සඳහන් ව ඇති කල් ඉකුත්වීමේ දිනය ඉක්මවා ඇති ආහාර වේ.
   (4) සතුන් හානි නොකළ පළුදු නොවූ ආහාර ය.

11. භික්ෂුන් වහන්සේලා වෙත දානය සකස් කිරීමේදී දායකයන් විසින් නොකළ යුතු ක්‍රියාව ඇතුළත් වරණය තෝරන්න.
   (1) කෘතිම රසකාරක හා රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාර තෝරා ගැනීම
   (2) ආහාර සැකසීමේදී ලුණු, තෙල් සහ සීනි ආදිය අවම වශයෙන් භාවිත කිරීම
   (3) සියලු පෝෂකාංග ඇතුළත් වනසේ ආහාර සකස් කිරීම
   (4) ස්වාභාවික කුළුබඩු භාවිතකොට ආහාර සැකසීම

● ප්‍රශ්න අංක 12 සිට 14 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීමට සුදුසු වචන තෝරන්න.

12. ඇතැම් බෞද්ධ නිකායවල සාමණේර භික්ෂූන් වහන්සේලාගේ අධිශීල සම්පන්න උපසම්පදා මහෝත්සවය පවත්වන්නේ .................... ඉදිකරන ලද පූජනීය සීමාමාලක මණ්ඩපයකය.

(1) පන්සලෙහි (2) බෝමළුවෙහි (3) ජලයෙහි (4) බුදුමැදුරෙහි

13. "අහසින් වැටෙන දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලායාමට ඉඩ නොදිය යුතු ය." යන්න ප්‍රකාශ කරන ලද්දේ .................... රජතුමා විසිනි.

(1) මහා පරාක්‍රමබාහු (2) දුටුගැමුණු (3) දේවානම්පියතිස්ස (4) ධාතුසේන

14. තමාගේ ශක්‍යතා තේරුම් ගෙන, ජීවිතයේ සාමාන්‍ය ආතතිය සඳහා සාර්ථකව මුහුණ දෙමින්, අභියෝග ජයගෙන, ඵලදායි පුද්ගලයකු හැටියට සමාජයානුගත වීම .................... ලෙස හැඳින්විය හැකි ය.

(1) ආධ්‍යාත්මික යහපැවැත්ම (2) මානසික සෞඛ්‍යය
(3) කායික සෞඛ්‍යය (4) සමාජීය සෞඛ්‍යය

15. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් පරිදි "සන්නිපාතිකා ආබාධා" යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) පිතෙන් හටගන්නා රෝග වේ. (2) සෙම නිසා හටගන්නා රෝග වේ.
(3) වාතයෙන් හටගන්නා රෝග වේ. (4) තුන්දොස් කිපීමෙන් හටගන්නා රෝග වේ.

16. ජලභීතිකාව, COVID 19 හා AIDS වැනි රෝග බෝවන්නේ,

(1) බැක්ටීරියාව මගිනි. (2) වෛරස් මගිනි.
(3) දිලීර මගිනි. (4) පරපෝෂිතයන් මගිනි.

17. අනතුරකදී අස්ථි විසන්ධි වීම යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) අස්ථි දෙක එකට බැඳ තබන බන්ධනිවලට හානි පැමිණීම ය.
(2) සන්ධිය හා සම්බන්ධ අස්ථි දෙක වෙන්වීම ය.
(3) අස්ථි හෝ හිස් කබල බිඳියාම ය.
(4) අස්ථි පේශියට සම්බන්ධවන බණ්ඩරාවලට හානිවීම ය.

18. වෛද්‍ය පරීක්ෂණයකින් අනාවරණය වූ පරිදි රෝගියකු උණ සහ කැස්ස, පපුවේ වේදනාව හා හුස්ම ගැනීමේ අපහසුතාව වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරයි. එම රෝගියාට වැළඳී ඇති රෝගය විය හැක්කේ,

(1) ක්ෂය රෝගය (Tuberculosis) වේ. (2) නියුමෝනියාව (Pheumonia) වේ.
(3) සෙම්ප්‍රතිශ්‍යාව (Common Cold) වේ. (4) මෙනින්ජ් පටල ප්‍රදාහය (Meningitis) වේ.

19. පහත දැක්වෙන අනතුරු අතරින් බාහිරව සිදුවන අනතුරක් වන්නේ,

(1) උළුක්කු වීම (Sprain) ය. (2) විසන්ධි වීම (Dislocation) ය.
(3) අස්ථි පිපිරීම (Fracture) ය. (4) පාදය සීරීමය (Scratch) ය.

20. මිනිස් සිරුර නිර්මාණය වී ඇති සෛලය පිළිබඳ සාවද්‍ය තොරතුර අඩංගු වරණය තෝරන්න.

(1) මිනිස් සිරුරේ මූලික තැනුම් ඒකකය සෛලයයි.
(2) හැඩයෙන්, ප්‍රමාණයෙන් හා ක්‍රියාකාරීත්වයෙන් සෛල විවිධ වේ.
(3) සෛලයේ ක්‍රියා පාලනය කරන්නේ න්‍යෂ්ටිය මගිනි.
(4) මිනිස් සිරුර තුළ න්‍යෂ්ටිය නොමැති සෛල නැත.

21. භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරි දිවි පැවැත්ම සඳහා භාවිත කළ හැකි ක්‍රියාකාරකම් යුගලක් වන්නේ,

(1) සක්මන් කිරීම හා යෝගී ව්‍යායාම කිරීම. (2) භාවනා කිරීම හා සක්මන් කිරීම.
(3) සක්මන් කිරීම හා සැතපීම. (4) භාවනා කිරීම යෝග ව්‍යායාම කිරීම.

22. මහා සංඝරුවනෙහි යහපැවැත්මට බාධාවන අහිතකර චර්යාවකි,

(1) වැරදි ආහාර පුරුදු අනුගමනය කිරීම. (2) නිසි ශරීර ස්කන්ධ දර්ශකයක් පවත්වා ගැනීම.
(3) පෞද්ගලික ස්වස්ථතාව රැකගැනීම. (4) ප්‍රමාණවත් නින්ද හා විවේකය ලබා ගැනීම.

23. පහත සඳහන් ක්‍රියා අතරින් අනිච්ඡානුගව සිදුවන ක්‍රියාවක් වන්නේ,

(1) හෘදය ස්පන්දනය වීම ය. (2) බඩගිනි වූ විට ආහාර පරිභෝජනය කිරීම ය.
(3) විහාර මිදුල ඇමදීම ය. (4) පූජා කිරීම සඳහා මල් දෝවනය කිරීම ය.

24. පරිභෝජනය සඳහා ආහාර තෝරා ගැනීමේ දී විටමින් සහ ඛනිජ ලවන එකවර ලබාගත හැකි ආහාරයක් වන්නේ,

(1) තම්බන ලද මඤ්ඤොක්කා ය. (2) මුං ඇට ව්‍යාංජනය ය.
(3) පළතුරු සලාද ය. (4) බදින ලද හතු ය.

25. බෝ මළුවේ සුළඟට සෙලවෙන බෝ කොළ, පහන් වැටෙහි දැල්වෙන පහන්, සුවඳ විහිදුවමින් දැල්වෙන හඳුන්කූරු යන උත්තේජ හඳුනා ගැනීම සඳහා දායකවන සංවේද ඉන්ද්‍රියය/ඉන්ද්‍රියයන් මොනවා ද?

(1) ඇස (2) නාසය (3) ඇස සහ නාසය (4) නාසය සහ සම

26. මිනිස්සිරුරේ යම් කිසි බලපෑමක් ඇති කිරීමට අංශු මාත්‍ර ප්‍රමාණවලින් අවශ්‍ය වන, නිර්නාල ග්‍රන්ථි මගින් ස්‍රාවය වන කාබනික රසායනික ද්‍රව්‍ය

(1) ටයලීන් ය. (2) ඇමයිනෝ අම්ල ය.
(3) හෝර්මෝන ය. (4) ආමාශයික යුෂය ය.

27. පොත් කියවීමට පහසුවුවද ඈත පිහිටි පන්සලෙහි නාම පුවරුවෙහි අකුරු පැහැදිලිව නොපෙනෙන බව සුධීර හිමි පවසයි. සුධීර හිමි පෙළෙන දෘශ්‍යාබාධය කුමක් ද?

(1) දුර දෘෂ්ටිකත්වය (2) අවිදූර දෘෂ්ටිකත්වය
(3) වර්ණ අන්ධතාව (4) ග්ලුකෝමාව

28. කර්ණ අස්ථිකා තුන පිහිටා ඇත්තේ,

(1) බාහිර කනෙහි ය. (2) මැද කනෙහි ය. (3) ඇතුළු කනෙහි ය. (4) කර්ණ ශංඛයෙහි ය.


29. BCG එන්නත ලබාදීමෙන් වැළකෙන රෝගය කුමක් ද?

(1) ක්ෂය රෝගය (2) කක්කල් කැස්ස
(3) ජැපනීස් එන්සෙපලයිටිස් (4) පෝලියෝ

30. සරම්ප, රුබෙල්ලා සහ කම්මුල්ගාය යන රෝගවලින් වැළකීම සඳහා ලබාදෙන එන්නත කුමක් ද?

(1) MMR
(2) JE
(3) ද්විත්ව එන්නත සහ පෝලියෝ මුඛ එන්නත
(4) ත්‍රිත්ව එන්නත

● පහත දී ඇති රුධිර ගණ ගැලපීම හා සබැඳි රූපසටහන හා තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **31** සහ **32** ට පිළිතුරු සපයන්න.



රුධිර ගණ

සුදේව හිමි සර්වදායක හිමි නමක් වන අතර භද්‍ර හිමි සර්ව ප්‍රතිග්‍රාහක හිමිනමකි.


31. මේ අනුව සුදේව හිමිගේ රුධිර ගණය කුමක් ද?

(1) A (2) B (3) AB (4) O

32. සඳු හිමිගේ රුධිර ගණය කුමක් ද?

(1) A (2) B (3) AB (4) O

● ප්‍රශ්න අංක **33** සිට **35** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සටහන උපයෝගී කරගන්න.




33. රූපයෙන් දැක්වෙන හිස්තැන පිරවීම සඳහා වඩාත් සුදුසු වචනය/වචන අඩංගු වරණය තෝරන්න.

(1) බෝවන රෝග (2) බෝනොවන රෝග
(3) රෝග (4) පෝෂණ ඌනතා රෝග

34. රූපයේ දැක්වෙන රෝග අතරින් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග මොනවා ද?

(1) HIV / AIDS සහ වෘක්ක ප්‍රදාහය. (2) උපදංශය සහ HIV / AIDS
(3) උපදංශය සහ අර්ශස් (4) HIV / AIDS සහ රක්තහීනතාව

35. රූපයේ දැක්වෙන රෝග අතරින් බහිස්ස්‍රාවී පද්ධතිය ආශ්‍රිත රෝගයක් වන්නේ,

(1) අර්ශස් ය. (2) උපදංශය ය. (3) වෘක්ක ප්‍රදාහය ය. (4) HIV/AIDS ය.

36. ආයුර්වේදයට අනුව ආයු යන්නෙහි අරුත කුමක් ද?

(1) දැනුම (2) නුවණ (3) ආයුෂ 4) සැප

37. ආයුර්වේදයට අනුව අංගපූර්ණ ආහාරයක් (සමබල ආහාරයක්) යනු,

(1) මධුර රස හා අම්ල රස අඩංගු ආහාර වේ.
(2) ලවණ රස හා කටු රස අඩංගු ආහාර වේ.
(3) තිත්ත රස හා කෂාය රස අඩංගු ආහාර වේ.
(4) ෂඩ් රස අඩංගු ආහාර වේ.

38. විසිරුණු මනස එක්තැන් වීම

(1) භාවනාව මගින් සිදුවේ. (2) පිරිත් ඇසීමෙන් සිදුවේ.
(3) ශාන්තිකර්ම මගින් සිදුවේ. (4) තෙල් මැතිරීමෙන් සිදුවේ.

39. භික්ෂූන් වහන්සේලාගේ පාරිභෝජනය සඳහා බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාල අෂ්ඨපාන වර්ගවලට අයත් අම්බපානය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) වියළි මිදිවලින් සාදන ලද පානයකි. (2) අමු මිදිවලින් සාදන ලද පානයකි.
(3) ඉදුනු ජම්බුවලින් සාදන ලද පානයකි. (4) ඉදුනු අඹවලින් සාදන ලද පානයකි.

● පහත සඳහන් *A*, *B* සහ *C* යන සිද්ධි යුගල අධ්‍යයනය කර ප්‍රශ්න අංක **40** ට පිළිතුරු සපයන්න.

*A* – (i) මානසික ව්‍යාකූලතාව ඇතිවීම
(ii) මානසික රෝග තත්ත්ව ඇතිවීම

*B* – (i) රාගය, ද්වේශය, මෝහය ප්‍රමුඛ කොට ඇති අවිධිමත් චර්යා පාලනය කිරීම
(ii) මානසික සෞඛ්‍යය හා කායික සෞඛ්‍යය පිරිහීම

*C* – (i) භික්ෂූන්වහන්සේලා ප්‍රජා කටයුතුවල නායකත්වය ගෙන කටයුතු කිරීම
(ii) භික්ෂූන්වහන්සේලාගේ ආත්මාභිමානය සංවර්ධනය වීම

40. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධිය/සිද්ධි යුගල වන්නේ,


(1) *A* ය. (2) *A* සහ *B* ය. (3) *A* සහ *C* ය. (4) *C* ය.

**වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | (3) | 21. | (1) |
| 02. | (4) | 22. | (1) |
| 03. | (1) | 23. | (1) |
| 04. | (4) | 24. | (3) |
| 05. | (3) | 25. | (3) |
| 06. | (4) | 26. | (3) |
| 07. | (2) | 27. | (2) |
| 08. | (2) | 28. | (2) |
| 09. | (4) | 29. | (1) |
| 10. | (3) | 30. | (1) |
| 11. | (1) | 31. | (4) |
| 12. | (3) | 32. | (3) |
| 13. | (1) | 33. | (3) |
| 14. | (2) | 34. | (2) |
| 15. | (4) | 35. | (3) |
| 16. | (2) | 36. | (3) |
| 17. | (2) | 37. | (4) |
| 18. | (2) | 38. | (1) |
| 19. | (4) | 39. | (4) |
| 20. | (4) | 40. | (3) |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය




**ප්‍රස්තාරය 2.1** (RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 38 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.95කි. එනම් 38 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 95%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නයේ පහසුතාව 95%ක් ලෙස දැක්විය හැකිය.

වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 3 | 17.51 | 9.04 | 63.09 | 10.17 | 0.19 |
| 2 | 4 | 20.15 | 21.66 | 20.72 | 37.29 | 0.19 |
| 3 | 1 | 72.50 | 14.12 | 9.23 | 3.58 | 0.56 |
| 4 | 4 | 22.41 | 22.79 | 21.47 | 32.58 | 0.75 |
| 5 | 3 | 6.40 | 9.79 | 76.08 | 7.53 | 0.19 |
| 6 | 4 | 3.95 | 3.58 | 6.03 | 86.25 | 0.19 |
| 7 | 2 | 3.20 | 72.88 | 19.77 | 3.58 | 0.56 |
| 8 | 2 | 17.33 | 31.26 | 40.11 | 10.92 | 0.38 |
| 9 | 4 | 11.11 | 7.72 | 11.68 | 68.55 | 0.94 |
| 10 | 3 | 5.65 | 4.14 | 81.92 | 7.34 | 0.94 |
| 11 | 1 | 86.44 | 5.65 | 5.27 | 2.07 | 0.56 |
| 12 | 3 | 29.00 | 7.53 | 56.69 | 6.40 | 0.38 |
| 13 | 1 | 76.27 | 7.53 | 4.52 | 11.49 | 0.19 |
| 14 | 2 | 25.99 | 29.00 | 9.79 | 34.46 | 0.75 |
| 15 | 4 | 15.07 | 37.66 | 14.88 | 32.02 | 0.38 |
| 16 | 2 | 7.91 | 77.78 | 8.85 | 5.27 | 0.19 |
| 17 | 2 | 19.77 | 56.31 | 9.04 | 14.50 | 0.38 |
| 18 | 2 | 23.92 | 52.92 | 15.07 | 7.91 | 0.19 |
| 19 | 4 | 9.23 | 7.34 | 3.39 | 78.91 | 1.13 |
| 20 | 4 | 30.13 | 19.59 | 14.69 | 33.90 | 1.69 |
| 21 | 1 | 29.00 | 60.45 | 2.26 | 8.10 | 0.19 |
| 22 | 1 | 85.31 | 5.46 | 4.52 | 4.52 | 0.19 |
| 23 | 1 | 65.54 | 21.09 | 7.53 | 5.46 | 0.38 |
| 24 | 3 | 13.75 | 36.53 | 42.00 | 7.16 | 0.56 |
| 25 | 3 | 3.58 | 5.08 | 85.50 | 5.65 | 0.19 |
| 26 | 3 | 12.99 | 35.03 | 39.92 | 11.49 | 0.56 |
| 27 | 2 | 60.08 | 20.90 | 9.98 | 8.29 | 0.75 |
| 28 | 2 | 15.44 | 22.98 | 20.34 | 40.68 | 0.56 |
| 29 | 1 | 50.28 | 16.20 | 9.60 | 22.98 | 0.94 |
| 30 | 1 | 32.39 | 10.55 | 29.38 | 26.55 | 1.13 |
| 31 | 4 | 8.47 | 8.66 | 25.61 | 56.31 | 0.94 |
| 32 | 3 | 6.40 | 12.81 | 57.06 | 22.60 | 1.13 |
| 33 | 3 | 15.07 | 28.63 | 44.26 | 11.30 | 0.75 |
| 34 | 2 | 43.13 | 32.02 | 10.92 | 13.75 | 0.19 |
| 35 | 3 | 59.70 | 9.42 | 20.72 | 8.85 | 1.32 |
| 36 | 3 | 7.34 | 3.39 | 81.54 | 7.16 | 0.56 |
| 37 | 4 | 12.05 | 5.84 | 19.77 | 61.39 | 0.94 |
| 38 | 1 | 87.38 | 3.01 | 2.45 | 7.16 | 0.00 |
| 39 | 4 | 11.49 | 9.04 | 10.73 | 67.80 | 0.94 |
| 40 | 3 | 12.99 | 30.51 | 42.75 | 12.99 | 0.75 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. 'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් හෝ අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

## 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

**වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක**

| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| සෞඛ්‍ය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය | 1,2,3,4,5,6,7,8,14 |
| සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය | 9,10,11,24 |
| පද්ධතිවල සෞඛ්‍යය | 16,17,18,19,20,23,25,26,27,28,29,30,31,32,33,34, 35, |
| බුදු දහම හා සෞඛ්‍යය | 12,13,15,21,22,38,39,40, |
| ආයුර්වේදය හා සෞඛ්‍යය | 36,37 |

I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විතය.


I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේදී පදනම් කරගත් තේමා සංඛ්‍යාව පහකි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය ඉහත වගුවේ සඳහන් කර ඇත. එක් එක් තේමාවට අදාළ මාතෘකා හා විෂය කරුණු ප්‍රමාණය අනුව ප්‍රශ්න සංඛ්‍යාව තීරණය කර ඇත. ප්‍රශ්න 40න් ප්‍රශ්න 17ක්ම ඉදිරිපත් කර ඇත්තේ පද්ධතිවල සෞඛ්‍යය යන තේමාවට අදාළවය.

සෞඛ්‍ය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය යන තේමාවට අදාළව ප්‍රශ්න නවයක් ද ඉදිරිපත් කර ඇති අතර බුදු දහම හා සෞඛ්‍යයට අදාළව ප්‍රශ්න අටක් ඉදිරිපත් කර ඇත.

සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය යන තේමාව සඳහා ඉදිරිපත්කොට ඇත්තේ ප්‍රශ්න හතරකි.

ප්‍රශ්න දෙකක් පමණක් ආයුර්වේදය හා සෞඛ්‍යය යන තේමාවට අදාළව ඉදිරිපත් කොට ඇත.

## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021
## 09 - සෞඛ්‍ය විද්‍යාව - I පත්‍රය
### තේමා අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය




**ප්‍රස්තාරය 2.2** (RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි)

සෞඛ්‍යය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්න නවය අතුරින් පහසුතාව වැඩිම ප්‍රශ්නය හයවෙනි ප්‍රශ්නයයි. එම ප්‍රශ්නයේ පහසුතාව 87%කි. මෙම තේමාව යටතේ ඉදිරිපත් වී ඇති ප්‍රශ්ණ නවයෙන් හයවෙනි ප්‍රශ්නය හැර, ඉතිරි ප්‍රශ්න 08න් ප්‍රශ්න හතරක පහසුතාව 63%ක ට වඩා වැඩිය. අනෙක් ප්‍රශ්න හතරෙහි පහසුතාව 38%ක ට වඩා අඩුය.

සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය හා තේමාව යටතේ ප්‍රශ්න හතරක් ඉදිරිපත් කර තිබුණි. එම ප්‍රශ්න හතරෙන් 11 ප්‍රශ්නයෙහි පහසුතාව 89%කි. ඉතිරි ප්‍රශ්න තුනෙන් ප්‍රශ්න දෙකක පහසුතාව 70% වඩා වැඩිය. 24 ප්‍රශ්නයෙහි පහසුතාව 47%කි.


1 වන ප්‍රශ්න පත්‍රයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් පද්ධතිවල සෞඛ්‍යය යන තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ අතර එම ප්‍රශ්න සංඛ්‍යාව 17කි. මෙම තේමාවට අදාළව පහසුතාව වැඩිම 25 ප්‍රශ්නයෙහි පහසුතාව 90%කි. ඉතිරි ප්‍රශ්න 16න් පහකම පහසුතාව 60%ට වැඩි වේ. මෙම තේමාව යටතේ පහසුතාව අඩුම 27 ප්‍රශ්නයෙහි පහසුතාව 26%කි.

බුදුදහම හා සෞඛ්‍යය යන තේමාව යටතේ ප්‍රශ්න අටක් ඉදිරිපත් කර ඇත. එහි 38 ප්‍රශ්නයේ පහසුතාව 95%කි. ඉතිරි ප්‍රශ්න හතෙන් ප්‍රශ්න හතරකම පහසුතාව 50%ට වැඩිය. 21 ප්‍රශ්නයේ පහසුතාව 33%කි.

ආයුර්වේදය හා සෞඛ්‍යය යන තේමාවට අදාළව ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කර තිබුණි. එහි පහසුතාව වැඩිම 36 ප්‍රශ්නයෙහි පහසුතාවය 88%කි.

**වගුව 2.4 තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව**

| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|
| සෞඛ්‍යය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය | 6, (87%) | 14, (32%) |
| සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය | 11, (89%) | 24, (47%) |
| පද්ධතිවල සෞඛ්‍යය | 25, (90%) | 27, (26%) |
| බුදුදහම හා සෞඛ්‍යය | 38, (95%) | 21, (33%) |
| ආයුර්වේදය හා සෞඛ්‍යය | 36, (88%) | 37, (68%) |




**ප්‍රස්තාරය 2.3**

## 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2021 වර්ෂයේ සෞඛ්‍ය විද්‍යාව විෂයයයේ 1 පත්‍රය සැකසීමේදී තේමා පහකට අදාළව ප්‍රශ්න 40ක් ඉදිරිපත් කර ඇත.

සෞඛ්‍යය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය තේමාවට අදාළ ප්‍රශ්න නවයෙන් ප්‍රශ්න පහකම පහසුතාව 50%ට වැඩිය. ප්‍රශ්න අංක 3,5,6,7 ප්‍රශ්නවල පහසුතාව 70%ට වැඩිය. මෙම තේමාව ප්‍රායෝගික ජීවිතය හා බැඳී ඇති බැවින් අපේක්ෂකයන් සාර්ථක ලෙස පිළිතුරු සපයා ඇති බව නිගමනය කළ හැකිය.

සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය තේමාවට අදාළව ඉදිරිපත් කර ඇති ප්‍රශ්න හතරෙන් ප්‍රශ්න අංක 9,10,11 යන ප්‍රශ්න තුනෙහිම පහසුතාව 70%ක ට වඩා වැඩිය. මෙම ප්‍රශ්න එදිනෙදා ජීවිතය හා බැඳුන ප්‍රශ්න බැවින් සාධනය ඉහළ මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය.

පද්ධතිවල සෞඛ්‍යය යන තේමාවට අදාළව ඉදිරිපත් කර ඇති ප්‍රශ්න 17න් 25 ප්‍රශ්නයෙහි පහසුතාව 90%ක් තරම් ඉහළ අගයක් ගෙන ඇති අතර ප්‍රශ්න දහයකම පහසුතාව 50%ට වැඩිය. තම පද්ධතිවල සෞඛ්‍යයවත් බව පවත්වා ගැනීම පිළිබඳ අපේක්ෂකයන්ගේ ආකල්ප ඉතා ඉහළ මට්ටමක පවතින බව මින් නිගමනය වන අතර, මෙම තත්ත්වය තවදුරටත් ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අපේක්ෂකයන් දිරිගැන්වීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත ගුරුභවතුන්ගේ වගකීමකි.

අංක 8, 14, 15, 21, 27, 28, 34 හා 35 යන ප්‍රශ්න 8 කෙරෙහි අවධානය යොමු කිරීමේදී ඉන් නිවැරදි වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතයට සාපේක්ෂව වැරදි එක් වරණයක් තෝරාගැනීම වෙත වැඩි අපේක්ෂකයන් ප්‍රතිශතයක් නැඹුරු වී ඇති බව පැහැදිලි වේ.

ප්‍රශ්න අංක 27 පද්ධතිවල සෞඛ්‍යය යන තේමාව යටතේ ඉදිරිපත් වී ඇති ප්‍රශ්නයක් වන අතර එහිදී නිවැරදි වරණය වූ දෙවන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 20.90ක් වන අතර වැරදි වරණයක් වූ පළමු වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 60.08කි.

මෙහිදී දුර හා අවිදුර දෘෂ්ටිකත්වය යන්න විද්‍යාත්මකව නිවැරදිව අපේක්ෂකයන් ග්‍රහණය කර නොතිබීම කැපී පෙනෙන අතර වචනාර්ථයට අවධානය යොමු කිරීමෙන් පමණක් පිළිතුර ලබා දී ඇති බව පැහැදිලි වේ. ප්‍රශ්න අංක 28 ද පද්ධතිවල සෞඛ්‍ය යන තේමාව යටතේ ඉදිරිපත්ව ඇති අතර එහිදී ද නිවැරදි වරණය වූ දෙවන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 22.98ක් පමණ වන අතර වැරදි වරණයක් වූ හතරවන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 40.68කි. කර්ණ අස්ථිකාවල පිහිටීම සම්බන්ධයෙන් විමසා ඇති එම ප්‍රශ්නයට අදාළව නිවැරදි පිළිතුර ලබාදීමට අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් අසමත් වී ඇත්තේ පද්ධති සම්බන්ධයෙන් දැනුම හා කුසලතාව අවම මට්ටමක පැවතීම හේතුවෙන් බව නිගමනය කළ හැකිය.

ප්‍රශ්න 34, 35 ද පද්ධතිවල සෞඛ්‍යය තේමාව යටතේම ඉදිරිපත්ව ඇති තවත් ප්‍රශ්න දෙකක් වන අතර මෙම ප්‍රශ්න සඳහාද නිවැරදි වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතයට සාපේක්ෂව වැරදි වරණයක් තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය ඉහළ අගයකි. මේ අනුව වැඩි දුරටත් පැහැදිලි වන්නේ සාමාන්‍ය සෞඛ්‍යමත් පිළිවෙත්වලට අදාළව අපේක්ෂකයන් සතුව යම් ප්‍රාමාණික දැනුමක් තිබුණද විද්‍යාත්මක කාරණා හා සබැඳි සෞඛ්‍යය පිළිබඳව ඇති දැනුම ඉතා අල්ප බවයි.

බුදුදහම හා සෞඛ්‍යය තේමාවට අදාළව ඉදිරිපත්කොට ඇති ප්‍රශ්න අටකි. එම තේමාවට අදාළ ප්‍රශ්න අතුරෙන් 38 ප්‍රශ්නයෙහි පහසුතාව 95%කි. එය I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව වැඩිම ප්‍රශ්නයයි. එහි ඉහළ පහසුතාවට හේතුව භික්ෂු ජීවිතය හා බෞද්ධ ආගමික වත් පිළිවෙත් හා සෘජුව සම්බන්ධ විෂය කරුණක් මින් විමසා තිබීම නිසා යැයි නිගමනය කළ හැකිය. ඉතිරි ප්‍රශ්න හතෙන් පහකම පහසුතාව 50%ට වැඩි වේ. අපේක්ෂකයන් මෙම තේමාව සඳහා ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කර ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

ආයුර්වේදය හා සෞඛ්‍යය යන තේමාව යටතේ ඉදිරිපත් වූ ප්‍රශ්න දෙකෙහිම පහසුතාව 68%ක ට වැඩි අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදෙන ගුරුභවතුන් එම ඒකකය පිළිබඳ සිසුන්ට ප්‍රාමාණික අවබෝධයක් ලබාදී තිබීම එයට හේතුව විය හැකිය.

සමස්තයක් වශයෙන් ගත්කළ 1 ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂකයන් සාර්ථක අන්දමින් පිළිතුරු සපයා ඇති බව නිගමනය කළ හැකි වේ.

සෞඛ්‍ය විද්‍යාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයෙහි නිරත ගුරුභවතුන්, අදාළ තේමා ප්‍රායෝගික ජීවිතය හා සමීප කරමින් පවතින සම්පත් අනුව, හැකි සෑම අවස්ථාවකදීම විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය භාවිත කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි නිරතවීම සුදුසු වේ. එසේම කාලීනව වෙනස්වෙමින් පවතින සෞඛ්‍ය ගැටලු , සෞඛ්‍යය හා සබැඳි නව සොයාගැනීම් පිළිබඳ දැනුවත්භාවය යාවත්කාලීන කර ගැනීමට ද යොමු වීමටද අත්‍යාවශ්‍ය වේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය කාලය - පැය 02යි.


පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීම වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

සෙසු ව්‍යුහගත රචනා ප්‍රශ්න හතෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

II වන පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 40 = 60

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම : | I පත්‍රය | = | 40 |
| | II පත්‍රය | = | 60 |
| | අවසාන ලකුණ | = | 100 |

## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

දෙවන ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 08කින් සමන්විත වන අතර පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එසේ වුවද පළමුවන ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 97.33%කි. ඉතිරි ප්‍රශ්න හතෙන් තෝරාගත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය. ඒ අතුරෙන් අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් පිළිතුරු සැපයීම සඳහා හතරවන ප්‍රශ්නය තෝරාගෙන තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස 77.33%කි. එම ප්‍රශ්න හතෙන් අපේක්ෂකයන් අඩුම පිරිසක් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන තිබුණේ හයවන ප්‍රශ්නය වන අතර, එය ප්‍රතිශතයක් ලෙස 12%කි.

**ප්‍රස්තාරය 3.1** (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය





**ප්‍රස්තාරය 3.2** (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත දැක්වෙන උදාහරණයෙන් පෙන්වා දී ඇත.

මෙහි පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් ද ඉතිරි ප්‍රශ්න හත සඳහා ලකුණු 10ක් බැගින් ද ලබා දී ඇත. පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න වලින් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතුය.

පළමුවන ප්‍රශ්නය සඳහා 46-58%ක අපේක්ෂකයන් පිරිසක් 51%-75% අතර ප්‍රාන්තරයේ එනම් ලකුණු 11-15 අතර ලබාගෙන ඇත. 0%-25% අතර ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-5 ත් අතර ලබා ඇති අපේක්ෂක ප්‍රතිශතය 10.27%කි. (එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 3.3** (RD/16/15/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු පිළිතුරු සපයා ඇති 1(iii) කොටසෙහි පහසුතා දර්ශකය 0.85%කි. එනම් 1(iii) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 85%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 85%ක් ලෙස දැක්විය හැකිය.

## 3.5. II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණුදීමේ පටිපාටිය

### 1 ප්‍රශ්නය

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය.
* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

**1.** සෞඛ්‍ය ප්‍රවර්ධන පිරිවෙනක් වන සිරිකර පිරිවෙනෙහි දී COVID 19 වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා තෙවන මාත්‍රාව ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පූර්ණ සහාය ඇතිව ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදහ. සෞඛ්‍යවත් පිරිවෙන් පරිසරයක් ඇති කිරීම සඳහා ගම්වාසීන් හා එක්ව පෙර දිනයෙහිදී පිරිවෙන් මිදුල ඇමදීම හා ජල පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදහ.

වැඩසටහන ආරම්භ කිරීමට පෙර ගම්වාසීන් අමතා බටහිර වෛද්‍යවරයා COVID 19 රෝගයෙන් ආරක්ෂාවීමට අනුගමනය කළ යුතු, මුඛ ආවරණ නිසි අයුරින් පළඳින ආකාරය වැනි, සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම පිළිබඳ දැනුවත් කළේ ය. අනතුරුව ආයුර්වේද වෛද්‍යවරයා දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව COVID 19 රෝගයෙන් ආරක්ෂාවීම සඳහා අනුගමනය කළ යුතු කොත්තමල්ලි පානය වැනි, පිළිවෙත් පිළිබඳ පැහැදිලි කළේ ය. කොළ කැඳ කෝප්පයකින් පැමිණ සිටි පිරිසට සංග්‍රහ කරන ලද්දේ ගම්වාසීන් විසිනි.

එන්නත් ලබාදීමේ වැඩසටහන අවසානයේ දී, ප්‍රමාණය දැන ආහාර අනුභව කිරීමෙන් රෝගාබාධ අඩුවීම වැනි යහපත් ප්‍රතිඵල ලැබෙන ආකාරය, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ පැමිණ සිටි පිරිසට පැහැදිලි කරදෙන ලදි. තවද භික්ෂුන් වහන්සේලා වෙත දානය සැකසීමේ දී කාබෝහයිඩ්‍රේට් (පිෂ්ටය) ඇතුළු අනෙකුත් පෝෂකාංග ප්‍රමාණවත් පරිදි අඩංගු සමබල ආහාරවේලක් සකස් කර දීමේ වැදගත්කම හා ආහාරවල පෝෂණගුණය වැඩිකර ගත හැකිවන පරිදි ආහාර සකස් කිරීමේ වැදගත්කම පෙන්වාදුන් පරිවේණාධිපති, භික්ෂුන්වහන්සේලා ආහාර තෝරා ගැනීමේදී කාබෝහයිඩ්‍රේට් අධික ආහාර අවම වශයෙන් තෝරා ගැනීමෙන්, දියවැඩියාව වැනි බෝනොවන රෝගවලින් වැළකී සිටිය හැකි ආකාරය පෙන්වා දුනි. වැඩසටහන අවසානයේදී පිරිවෙන හා පරිසරය පිරිසිදුකොට, ගම්වාසීන් සතුටින් විසිර ගිය හ.

- මෙම සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සෞඛ්‍ය නිලධාරීන්ගේ සහාය ඇතිව පවත්වන ලද මෙම එන්නත්කරණ වැඩසටහන, සෞඛ්‍ය ප්‍රවර්ධන ක්ෂේත්‍ර අතුරින් අයත්වන ක්ෂේත්‍රය කුමක් ද?

(ii) මෙම වැඩසටහනේදී ප්‍රජා සහභාගිත්වය ලබාදුන් අවස්ථා දෙකක් සිද්ධිය ඇසුරින් ලියා දක්වන්න.

(iii) බටහිර වෛද්‍යවරයා පැහැදිලි කළ ආකාරයට COVID -19 රෝගයෙන් වැළකීම සඳහා ඉහත ඡේදයෙහි සඳහන් කරුණුවලට අමතරව අනුගමනය කළහැකි වෙනත් සෞඛ්‍ය පුරුදු දෙකක් ලියන්න.

(iv) දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව රෝගය වැළඳීමෙන් ආරක්ෂාවීම සඳහා මෙම ඡේදයේ සඳහන් කරුණු වලට අමතරව අනුගමනය කළ හැකි වෙනත් ක්‍රම දෙකක් ලියන්න.

(v) පමණ දැන ආහාර අනුභව කිරීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵලයක් වන රෝගාබාධ අඩුවීම හැර, වෙනත්

(vi) සිද්ධියේ දක්වා ඇති පෝෂකාංගයට අමතරව සමබර ආහාරවේලක අඩංගු විය යුතු අනෙකුත් පෝෂකාංග හතර නම් කරන්න.

(vii) දියවැඩියාව හැර, වැරදි ආහාර පුරුදු හේතුවෙන් වැළඳිය හැකි වෙනත් බෝනොවන රෝග දෙකක් සඳහන් කරන්න.

(viii) ගම්වාසීන් විසින් පැමිණි පිරිස වෙත ලබාදුන් කොළ කැඳවල පෝෂණමය වටිනාකම කෙටියෙන් දක්වන්න.

**(ix) පිරිවේනාධිපති ස්වාමීන් වහන්සේ සඳහන් කළ පරිදි පෝෂණ ගුණය වැඩිවන ආකාරයට ආහාර සකස් කරගත හැකි ක්‍රම දෙකක් ලියන්න.**

**(x) මෙවැනි වැඩසටහන් සංවිධානයෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තුළ සංවර්ධනය වන සමාජ කුසලතා (social skills) දෙකක් ලියන්න.**

**පිළිතුරු**

(i) සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය

(නිවැරදි පිළිතුරට ලකුණු 02යි)

(ii)
- පිරිවෙන් මිදුල ඇමදීමට
- ජල පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානයට
- පැමිණ සිටි පිරිසට කොළ කැඳ කෝප්පයකින් සංග්‍රහ කිරීමට
- වැඩසටහන අවසානයේදී පිරිවෙන පිරිසිදු කිරීමට ........

**මෙවැනි අදහස් ගම්‍ය වන පරිදි ලියා තිබූ නිවැරදි පිළිතුරකට ලකුණ බැගින්**

1 x 2 = ලකුණු 02යි

(iii)
- සබන් යොදා හොඳින් අත් සේදීම. (අවම වශයෙන් තත්.20ක් පමණ)
- සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම. (දෙදෙනෙකු අතර මීටර් 1.5 ක පමණ දුරක සිටීම.)
- නියමිත කලට එන්නත් මාත්‍රා ලබාගැනීම.
- ජනයා ගැවසෙන ස්ථානවලට යාම හැකිතාක් සීමා කිරීම.
- සෞඛ්‍ය සම්බන්ධව පනවා ඇති නීති රීතිවලට අනුගතව ක්‍රියා කිරීම.

**මෙවැනි අර්ථ ගම්‍ය වන පරිදි ලියා තිබූ පිළිතුරු සඳහා එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්**

1 x 2 = ලකුණු 02යි

(iv)
- දිනකට අවම වශයෙන් දෙවරක්වත් හුමාලය ඇල්ලීම.
- සීතල ආහාර (අයිස් ක්‍රීම්) පරිභෝජනය මෙම කාලය තුළ සීමා කිරීම.
- ප්‍රතිශක්තිකරණය වඩවන දේශීය ඖෂධ සුදුසු පරිදි පානය කිරීම.
- මුඛ ආවරණ සුදුසු පරිදි පැළඳීම.

**මෙවැනි අදහස් ගම්‍ය වන පරිදි ලියා තිබූ පිළිතුරු සඳහා නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්**

1 x 2 = ලකුණු 02යි

(v)
- ශරීරයේ සැහැල්ලු බවක් ඇතිවීම.
- කාය ශක්තිය වැඩිවීම.
- පහසු පැවැත්මක් ඇතිකර ගත හැකි වීම.
- ආයුෂ වැඩිවීම.

**මෙවැනි නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්** 1 x 2 = ලකුණු 02යි

(vi)
- ප්‍රෝටීන්
- විටමින්
- මේද
- ඛනිජ

(කාබෝහයිඩ්‍රේට / පිෂ්ඨය සඳහා ලකුණු නැත.)

**නිවැරදි පිළිතුරකට ලකුණු ½ බැගින්** ½ x 4 = ලකුණු 02යි

(vii)

- අධික රුධිර පීඩනය
- රක්තහීනතාවය
- ගලගණ්ඩය
- තමස් අන්ධතාව
- මන්දපෝෂණය
- අර්ශස් රෝගය
- බිටෝලප ඇතිවීම
- පිලිකා (ආහාර මාර්ග ආශ්‍රිත)
- හෘද අකර්මන්‍යතාව
- ස්ථූලතාව
- මලබද්ධය
- ගැස්ට්‍රයිටිස්

**නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි**

(viii)

- සියලුම පෝෂකාංග එනම් කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේද, විටමින් හා ඛනිජ ලවන සියල්ල අඩංගු ආහාරයකි කොළ කැඳ / සමබල ආහාරයකි.

**මෙම අදහස ගම්‍ය වන පරිදි ලියාතිබූ පිළිතුර සඳහා ලකුණු 02යි**

(ix)

- අමුවෙන් ගත හැකි ආහාර අමුවෙන් ගැනීම.
  උදා - ගොටුකොළ සලාදය, කැරට්, පිපිඤ්ඤා, කරපිංචා දළු සම්බෝල / සලාද වශයෙන් ගැනීම.
- මිශ්‍ර ආහාර ලෙස සැකසීම.
  උදා - හත්මාලුව, ලබු කිරිබත්, මුං කිරිබත්
- විවිධ පෝෂක ද්‍රව්‍ය ආහාරයට එක්කර ගැනීම.
  උදා - ආහාරය පිළියෙල කර ලිපෙන් බාගත් පසු දෙහි සහ අයඩීන් මිශ්‍ර ලුනු එකතු කිරීම, උම්බලකඩ මිශ්‍ර කිරීම, පොල් එකතු කිරීම.

**මෙම අදහස් ගම්‍ය වන පරිදි ලියාතිබූ පිළිතුරු සඳහා නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි**


(x)

- කණ්ඩායමක සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව ඇති වීම.
- අන්‍ය මතවලට ඇහුම්කන් දීමට හැකියාව.
- අන්‍යයන්ට ගරු කිරීමට හැකියාව.

**වැනි නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි**

**මුළු එකතුව 2 x 10 = ලකුණු 20යි**

### 3.5.1. 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.4 (a)

පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන්,

0-5 ප්‍රාන්තරයේ 10%ක් ද,
6-10 ප්‍රාන්තරයේ 29%ක් ද,
11-15 ප්‍රාන්තරයේ 47%ක් ද,
16-20 ප්‍රාන්තරයේ 14%%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 61% කි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් සතුටුදායක සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත.




ප්‍රස්තාරය 3.4 (b)

සෞඛ්‍ය විද්‍යාව II පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය කොටස් 10කින් සමන්විත වේ. පහසුතාව වැඩිම (iii) කොටසෙහි පහසුතාව 85%කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට පහසු වී ඇත්තේ එය කාලීනව විශේෂ අවධානයට යොමු වූ ප්‍රායෝගික ජීවිතය හා සබැඳි ප්‍රශ්නයක් බැවිනි.

දෙවනුව පහසුතාව වැඩිම (ii) කොටසෙහි පහසුතාව 81%කි. තෙවන වැඩි පහසුතාව වන 77% (iv) කොටස සඳහා ය. v හා vi කොටස්හි පහසුතාව 69% ක්ද (vii) වැනි කොටසෙහි පහසුතාව 65%ක් ද වේ. මෙම කොටස්වල පහසුතාව ඉහළ මට්ටමක පවතින්නේ එම ප්‍රශ්න ප්‍රායෝගික ජීවිතය හා බද්ධ වූ මෙන්ම කාලීන අද්දැකීම් පදනම් කරගෙන ඇති නිසා බව නිගමනය කළ හැකිය.

(viii),(ix),(x) යන කොටස්වල පහසුතාව පිළිවෙලින් 33%, 38%, 30% ලෙස අඩු මට්ටමක පවතී. I වන කොටසේ පහසුතාව 9%කි. මෙයට හේතුව වශයෙන් සඳහන් කළ හැක්කේ සෞඛ්‍ය ප්‍රවර්ධන තේමාව පිළිබඳ සිසුන්ගේ අඩු දැනුවත්භාවයයි. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත ගුරුභවතුන් එවැනි මාතෘකා පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම යෝග්‍ය වේ.

## 2 ප්‍රශ්නය

**2. (i) බුදු දහමෙහි සඳහන් කාමසුඛල්ලිකානුයෝගය සහ අත්තකිලමතානුයෝගය කෙටියෙන් දක්වන්න.** *(ලකුණු 02 යි)*

**(ii) භික්ෂුවක් කාමසුඛල්ලිකානුයෝගය අනුගමනය කිරීමෙන් පුද්ගල සෞඛ්‍යයට ඇතිවන හානි තුනක් සඳහන් කරන්න.** *(ලකුණු 03 යි)*

**(iii) මෙම අන්ත දෙකෙන් ඉවත්ව මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් කායික සෞඛ්‍යය යහපත්ව පවත්වා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.** *(ලකුණු 05 යි)*

**පිළිතුරු**

(i) කාමසුඛල්ලිකානුයෝගය - ඉන්ද්‍රියයන් අධිකව සන්තර්පනය කිරීම.
අත්තකිලමථානුයෝගය - නිරිහාරව සිටිමින් ශරීරයට අධික දුක් දීම.

මෙම අදහස් ගම්‍ය වන පරිදි ලියා තිබූ පිළිතුරු සඳහා නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්

1 x 2 = ලකුණු 02යි

(ii)
- කායික අලංකරණ ද්‍රව්‍යවලින් ආසාදන ඇතිවීම.
- සුඛොපභෝගී ආහාර අධික වීම මගින් රෝග හටගැනීම.
- විසිතුරු ඇඳුම් මගින් පරිසරයට හා සෞඛ්‍යයට අහිතකර වීම.
- මත්ද්‍රව්‍ය භාවිතයෙන් හානි වීම.
- කාර්ය බහුල අවිවේකී ජීවිතය හේතුවෙන් රෝගවලට භාජනය වීම.


මෙවැනි අදහස් ගම්‍ය වන පරිදි ලියා තිබූ පිළිතුරු සඳහා නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්

1 x 3 = ලකුණු 03යි

(iii) මධ්‍යම ප්‍රතිපදාව අනුමගනයෙන් කායික සෞඛ්‍යය යහපත්ව පවත්වා ගත හැකි ආකාරය ලියා දක්වා ඇති ආකාරය අනුව උපරිම ලකුණු 05 ක් වන සේ සුදුසු පරිදි ලකුණු ලබාදීම සිදුකරන ලදි.

එකතුව = 2 + 3 + 5 = ලකුණු 10යි

### 3.5.2 02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.5 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 72.33%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ. ඉන්,

0-2 ප්‍රාන්තරයේ 14%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 33%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 33%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 20%ක් ද,

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රමාණය 53%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රමාණය 47%කි. සමස්තයක් ලෙස ගත් කළ මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී අපේක්ෂකයන් සැළකිය යුතු මට්ටමේ සාධනයක් පෙන්නුම් කර ඇත.




ප්‍රස්තාරය 3.5 (b)

මෙම ප්‍රශ්නයට අයත් කොටස් තුනෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහාය. එහි පහසුතාව 78%කි.

පොදුවේ ගත්කළ බුද්ධහම හා සෞඛ්‍යයෙහි වැදගත්කම පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුවත්භාවය සතුටුදායක මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය. මෙම ප්‍රශ්නයේ (iii) කොටසට අදාළ ආකාරයේ ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට හැකි පරිදි අපේක්ෂකයන්ගේ තාර්කික අවබෝධය වර්ධනය කිරීමට සුදුසු ලෙස පරිවේණාචාර්යවරුන් තම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

## 3 ප්‍රශ්නය

3. (i) "ප්‍රතිශක්තිකරණය" යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) රෝගවලින් ආරක්ෂාවීම සඳහා පෞද්ගලික ස්වස්ථතාව මෙන්ම පරිසරයේ පවිත්‍රතාව පිළිබඳ සැලකිළිමත් විය යුතු වේ. භික්ෂූන් වහන්සේ නමක් විසින් පිරිවෙන් පරිසරයේ පවිත්‍රතාව රැකගැනීම සඳහා අනුගමනය කළ යුතු යහපුරුදු තුනක් ලියන්න. (ලකුණු 03 යි)

(iii) තම පෞද්ගලික ස්වස්ථතාව පවත්වාගැනීම සඳහා භික්ෂූන් වහන්සේ නමක් පිළිපැදිය යුතු යහපුරුදු පහක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**පිළිතුරු**

(i) • සිරුර තුළ රෝගවලට ඔරොත්තු දීම සඳහා ස්වභාවයෙන්ම පිහිටි ශක්තිය සහ හැකියාව හෙවත් ස්වාභාවික ප්‍රතිශක්තිය දුර්වල වූ අවස්ථාවක බාහිර උපක්‍රම මගින් ඇතැම් රෝගවලට ශරීරය තුළ ප්‍රතිශක්තිය නිර්මාණය කිරීම (පරිචිත ප්‍රතිශක්තිය / කෘත්‍රිම ප්‍රතිශක්තිය) සඳහා විවිධ එන්නත් ලබාදීම ප්‍රතිශක්තිකරණය නම් වේ. මෙහිදී ඇතැම් රෝගකාරක මගින් නිකුත් කරනු ලබන විෂ සුළු සාන්ද්‍රණවලින් සිරුරට ලබාදීම සිදු කෙරේ.

• විවිධ රෝග සඳහා විවිධ එන්නත් වර්ග විවිධ කාලවලදී ලබාදීම ප්‍රතිශක්තිකරණය මගින් සිදුකරයි.

මෙම අදහස් ගම්‍ය වන පරිදි ලියාතිබූ පිළිතුරු සඳහා ලකුණු 02යි

(ii) පිරිවෙන් පරිසරයේ පවිත්‍රතාව රැකගැනීම සඳහා අනුගමනය කළ යුතු යහපුරුදු

- කසල ක්‍රමවත්ව බැහැර කිරීම.
- ජලය ලබාගන්නා ස්ථාන පිරිසිදුව තබා ගැනීම.
- වැසිකිළි, කැසිකිළි ක්‍රමවත්ව නඩත්තු කිරීම.
- කානු පද්ධතිය ජලය ගලායන පරිදි නඩත්තු කිරීම.
- පොලිතීන්, ප්ලාස්ටික්, වීදුරු වැනි අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම හා ප්‍රතිචක්‍රීකරණය.
- පොල්කටු, ටයර්, වැහිපීලි, මල්පෝච්චි වැනි දේවල වතුර රැඳීම වැළැක්වීම.
- පිරිවෙණ සහ පාසල් පරිශ්‍රය පිරිසිදුව තබාගැනීම.

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii) පෞද්ගලික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු යහපුරුදු


- කෑමට පෙර හා පසුව සබන් ගා අත සේදීම.
- උදේ සහ රාත්‍රියට කෑමෙන් පසු දත් මැදීම.
- හිස, නියපොතු නිසි ලෙස පවිත්‍රව තබා ගැනීම.
- සනීපාරක්ෂක වැසිකිළි භාවිතය සහ වැසිකිළි යාමෙන් පසු සබන් ගා අත් සේදීම.
- පිරිසිදු ඇඳුම් භාවිත කිරීම.
- යට ඇඳුම් නිතිපතා පිරිසිදු කිරීම.
- කිවිසුම් යාමේදී මුඛය හා නාසය ආවරණය කර ගැනීම.

- රෝගීන් හා ජනයා ගැවසෙන ස්ථානවලදී ආරක්‍ෂා වීම.
- උතුරා නිවාගත් ජලය පානය කිරීම.
- සෞඛ්‍යවත් සමබල ආහාර වේලක් පරිභෝජනය කිරීම.
- නිවැරදි ආහාර පුරුදු අනුගමනය කිරීම.
- මත්ද්‍රව්‍ය, දුම්පානය හා බුලත් විට භාවිතයෙන් වැළකීම.
- සැමවිටම සතුටින් සිටීම.
- ප්‍රමාණවත් නින්ද සහ විවේකය ලබාගැනීම.
- දිනපතා ඇඟ වෙහෙසන ශාරීරික ක්‍රියාකාරකම්වල (ව්‍යායාම) සුදුසු පරිදි නිරත වීම.
- සුදුසු විනෝදාංශවල නිරත වීම.

**නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 5 = ලකුණු 05යි**

**එකතුව = 2 + 3 + 5 = ලකුණු 10යි**

### 3.5.3 03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.6 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 64%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ. අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීමේ දී

0-2 ප්‍රාන්තරයේ 9%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 28%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 17%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 46%ක් ද,

ලෙසින් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 63%ක් වන අතර ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 37%කි. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවක් ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත.




ප්‍රස්තාරය 3.6 (b)

මෙම ප්‍රශ්නයට අයත් කොටස් තුන අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (ii) කොටස සඳහා ය. එහි පහසුතාව 80%කි.

ලකුණු ලබාගැනීම පිළිබඳ ඉහත නිරීක්ෂණ වලින් නිගමනය කළ හැක්කේ මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට තෝරාගත් අපේක්ෂකයන් තුළ පෞද්ගලික හා සාමාජයීය සෞඛ්‍යය පිළිබඳ මනා අවබෝධය ඇති බවයි. පාරිභාෂික වචන කෙරෙහි අපේක්ෂකයන් පුරුදු පුහුණු කිරීම සඳහා එවැනි වචන ආශ්‍රිතව ක්‍රියාකාරකම් සිදු කිරීම වඩාත් සුදුසු වේ.

**4 ප්‍රශ්නය**

**4. (i) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වේගයෙන් ව්‍යාප්තවන ඩෙංගු රෝගයේ රෝග කාරකය හා වාහකයා නම් කරන්න.**

*(ලකුණු 02යි)*

**(ii) ඩෙංගු රෝගයේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.**

*(ලකුණු 03යි)*

**(iii) පිරිවෙන්වාසී භික්ෂූන් වහන්සේලා සහ අවට ප්‍රජාව ඩෙංගු රෝගයෙන් වලක්වා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න.** *(ලකුණු 05යි)*

**පිළිතුරු**

(i) රෝග කාරකය - ඩෙංගු වෛරසය

රෝග වාහකයා - ඩෙංගු මදුරුවා (ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බොපික්ටස් යන මදුරු විශේෂය)

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින්
1 x 2 = ලකුණු 02යි


(ii)
- දින 4 - 6 ක් පමණ පවතින තද උණ
- තදබල ඇඟපත වේදනාව
- කඳුළු ගැලීම සහ ඇස් රතු වීම
- ඔක්කාරය, වමනය හා ආහාර අරුචිය
- සමේ රත් පැහැති පැල්ලම් ඇතිවීම

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii)
- මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ජීවත්වන ස්ථානවල ඉවතලන ටින්, පොල්කටු, යෝගට් කෝප්ප, ටයර්, සිලිමලු, බෝතල් ආදිය ඉවත් කිරීම හෝ වළලා දැමීම.
- අවහිර වී ඇති වැහි පීලි, මල් බඳුන් ජලය එක්රැස්වන ස්ථාන නිතර පිරිසිදු කිරීම.
- කුහුඹු උගුල් ඉවත් කිරීම.
- ඩෙංගු රෝගය හා සෞඛ්‍යය පවත්වා ගැනීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- දිනපතා පිරිවෙන පිරිසිදුව තබාගැනීමට කටයුතු කිරීම.
- දුමායනය මගින් මදුරුවන් පළවා හැරීමට කටයුතු කිරීම.
- ඩෙංගු රෝගීන් සිටී නම් ප්‍රතිකාර සඳහා ආරෝග්‍යශාලා වෙත යොමු කරවීම.
- මදුරු දැල් භාවිතයට යොමු කරවීම.
- මදුරු කොයිල් ආදිය භාවිතයෙන් මදුරුවන් පලවා හැරීමට කටයුතු කිරීම.

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 5 = ලකුණු 05යි
එකතුව = 2+3+5 = ලකුණු 10යි

### 3.5.4 04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.7 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව, මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 77.33%කි. අනිවාර්ය පළමුවන ප්‍රශ්නය හැරුණුකොට අපේක්ෂකයන් වැඩිදෙනෙක් පිළිතුරු සැපයීමට මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන්,

0-2 ප්‍රාන්තරයේ 9%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 21%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 31%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 39%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වඩා ලකුණු ලබාගත් අපේක්ෂක පිරිස 70%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂක පිරිස 30%කි.



ප්‍රස්තාරය 3.7 (b)

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විතය.

මෙම ප්‍රශ්නයට යම් ඉහළ මට්ටමේ සාධනයක් පෙන්වා ඇත්තේ කාලීනව, විශේෂ අවධානයට යොමු වූ සෞඛ්‍ය ගැටලු පිළිබඳ මනා අවබෝධයකින් යුතුව අපේක්ෂකයන් කටයුතු කිරීම නිසා බව සිතිය හැකිය. එහෙත් ඩෙංගු රෝගයේ රෝග කාරකයා හා වාහකයා පිළිබඳව අපේක්ෂකයන් සතුව මනා දැනුමක් නොමැති බව පැහැදිලි වේ. එම නිසා මෙවැනි විද්‍යාත්මක කරුණු කෙරෙහි අපේක්ෂකයන් වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා එවැනි විද්‍යාත්මක නාම හා සෞඛ්‍ය සම්බන්ධ විද්‍යාත්මක විෂය කරුණු ශිෂ්‍යයන් වෙත පහසුවෙන් ස්මරණය කරගත හැකි පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රායෝගික නැඹුරුවකින් යුක්තව සිදු කිරීමට පරිවේණාචාර්යවරුන් අවධානය යොමු කළ යුතුය.

## 5 ප්‍රශ්නය

**5. (i) නියුමෝනියාව සහ ලියුකේමියාව යන රෝග, සෘජුවම බලපාන පද්ධති දෙක ලියන්න.** *(ලකුණු 02යි)*

**(ii) භික්ෂූන් වහන්සේ නමක් සක්මනෙහි යෙදීමේදී චලනය සඳහා භාවිත වන ප්‍රධාන පද්ධති තුන සඳහන් කරන්න.** *(ලකුණු 03යි)*

**(iii) (අ) ආහාර ජීරණ පද්ධතියේ ප්‍රධාන කාර්ය තුන මොනවා ද?**

**(ආ) බහිස්‍රාවී පද්ධතියේ යහපැවැත්ම සඳහා භික්ෂූන් වහන්සේ නමක් විසින් අනුගමනය කළ යුතු යහපුරුදු දෙකක් ලියන්න.** *(ලකුණු 05යි)*

**පිළිතුරු**

(i) නියුමෝනියාව - ශ්වසන පද්ධතිය

ලියුකේමියාව - රුධිර සංසරණ පද්ධතිය

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි

(ii)
- අස්ථි පද්ධතිය
- පේශි පද්ධතිය
- ස්නායු පද්ධතිය

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii) (අ)

- ආහාර ජීර්ණය කිරීම.
- ජීර්ණය වූ ආහාර සිරුරට අවශෝෂණය කිරීම.
- අපද්‍රව්‍ය මල වශයෙන් සිරුරෙන් බැහැර කිරීම.

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි


(ආ)

- හැකි සෑම විටම උණුකර නිවාගත් ජලය ප්‍රමාණවත් පරිදි පානය කිරීම
- මත්පැන් පානයෙන් හා දුම් පානයෙන් වැළකීම
- වර්ණ හා විවිධ කෘත්‍රිම රසකාරක යෙදූ ආහාර පාන පරිභෝජනයෙන් වැළකීම
- වෛද්‍ය උපදෙස් රහිතව ඖෂධ භාවිතයෙන් වැළකීම
- යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම
- දිනපතා තෝරාගත් වේලාවක් තුළ ව්‍යායාම්වල නිරත වීම

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි

එකතුව = 2 + 3 + 5 = ලකුණු 10යි

### 3.5.5 05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.8 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 36.67%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන්,

0-2 ප්‍රාන්තරයේ 22%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 35%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 25%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 18%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වඩා ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 43% කි. අපේක්ෂකයන් 57% ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත.




ප්‍රස්තාරය 3.8 (b)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී වැඩි සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත්තේ (iii) (ආ) කොටසටය. එහි පහසුතාව 51%කි. මෙම ප්‍රශ්නය සඳහා අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත්තේ පද්ධති වල සෞඛ්‍යය තේමාව හා සම්බන්ධ අවබෝධය ප්‍රශස්ථ මට්ටමක නොමැති වීම හේතුවෙන් බව සිතිය හැකිය. මෙය I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රකටව මතු වූ කරුණක් බැවින් පද්ධතිවල සෞඛ්‍යය යන තේමාව යටතේ ඇති විෂය කරුණු ශිෂ්‍යයන්ට පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි සරල හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් භාවිතයෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමට පරිවේණාචාර්යවරුන් තම ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු ය.

## 6 ප්‍රශ්නය

6. (i) ආයුර්වේදයට අනුව "චිකිත්සාව" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(ලකුණු 02යි

(ii) ගිලන්වූ භික්ෂූන්ට බෙහෙත් පිණිස භාග්‍යවතුන් වහන්සේ අනුදැන වදාළ මුල් බෙහෙත් (මූලභේසජ්ජ-ගස්වල මුල් නැතහොත් අලය යොදා ගන්නා බෙහෙත්) වලට උදාහරණ තුනක් ලියා දක්වන්න.

(ලකුණු 03යි

(iii) ආයුර්වේදයේ ප්‍රතිකාර සඳහා යොදාගන්නා පංච කර්ම චිකිත්සාව ට අයත් ප්‍රධාන ප්‍රතිකාර ක්‍රම පහ සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

(ලකුණු 05යි

**පිළිතුරු**

(i) • රෝග හේතු දුරුකර ගැනීම සඳහා ඊට සුදුසු ඖෂධ හා ප්‍රතිකාර යෙදීම චිකිත්සාව නම් වේ.

මෙම අදහස ගම්‍ය වන පරිදි ලියාතිබූ පිළිතුර සඳහා ලකුණු 02යි

(ii) මුල් බෙහෙත් (මූලභේසජ්ජ)

- කහ (හලිද්දිං)
- ඉඟුරු (සිඞ්ගිවෙරං)
- වදකහ (වචං)


නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii)
- වමන - වමනය මගින් දෝෂ පහකිරීම
- විරේචන - විරේක කිරීම මගින් දෝෂ පහකිරීම
- වස්ති - ගුද මාර්ගයෙන් ඖෂධ ඇතුළු කොට ප්‍රතිකාර කිරීම
- නස්‍ය - නාසය මගින් ඖෂධ ඇතුළු කොට ප්‍රතිකාර කිරීම
- රක්ත මෝක්ෂය - අපිරිසිදු ලේ ඉවත්කොට ප්‍රතිකාර කිරීම

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 5 = ලකුණු 05යි

එකතුව = 2 + 3 + 5 = ලකුණු 10යි

### 3.5.6 06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.9 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 12%කි. එය සිසුන් අඩුම ප්‍රමාණයක් තෝරාගත් ප්‍රශ්නය වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

0-2 ප්‍රාන්තරයේ 50%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 33%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 17%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 0%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ගත් සංඛ්‍යාව 83%කි. අපේක්ෂකයනගෙන් 17%ක් ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත. කිසිවෙකු ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන නොමැත.




ප්‍රස්තාරය 3.9 (b)

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විතය.

සමස්තයක් වශයෙන් ගත්කල මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේ දී ඉතා අඩු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙම ප්‍රශ්නය නියෝජනය කරන ආයුර්වේදය හා සෞඛ්‍යය පිළිබඳ තේමාව කෙරෙහි පරිවේණාචාර්යවරුන්ගේ වැඩි අවධානයක් යොමු විය යුතු ය. ආයුර්වේදය සම්බන්ධ අමතර පොතපත පරිශීලනය මගින්ද ශිෂ්‍යයන්ගේ දැනුම වර්ධනය කරගැනීම සඳහා ඔවුන්ව යොමුකිරීම මගින්ද මෙවැනි ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය ඉහළ නංවාගත හැකිය.

## 7 ප්‍රශ්නය

**7. (i) සමථ භාවනාව සහ විදර්ශනා භාවනාව කෙටියෙන් අර්ථ දක්වන්න.**

*(ලකුණු 02යි)*

**(ii) රාගය, ද්වේශය හා මෝහය ප්‍රමුඛ කොට ඇති අවිධිමත් චර්යා පදනම් කොටගෙන පුද්ගලයන් වර්ග කර ඇති එක් ආකාරයක් ලෙස "රාග චරිත ඇත්තා" හැඳින්විය හැකිය. එවැනි වෙනත් පුද්ගල වර්ග තුනක් සඳහන් කරන්න.**

*(ලකුණු 03යි)*

**(iii) "මානසිකව කෙරෙන ගුණාත්මක සංවර්ධනයකින් රෝග මග හරවා කායික හා මානසික සනීපාරක්ෂාව ඇතිකර ගත හැකි ය." මෙම කියමන සනාථ කිරීම සඳහා බෞද්ධ සාහිත්‍යයේ සඳහන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද දේශනා දෙකක් තෝරාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.**

*(ලකුණු 05යි)*

**පිළිතුරු**

(i) • සමථ භාවනාව - සමාධි භාවනාව / චිත්ත භාවනාව - සමාධිය දියුණු කිරීම ය.
• විදර්ශනා භාවනාව - ත්‍රි ලක්ෂණ භාවනාව / ප්‍රඥා භාවනාව - ප්‍රඥාව දියුණු කිරීම ය.

මෙම අදහස් ගම්‍ය වන පරිදි ලියා තිබූ පිළිතුරු සඳහා නිවැරදි පිළිතුරකට
ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි


(ii) • ද්වේෂ චරිත ඇත්තා
• මෝහ චරිත ඇත්තා
• ශ්‍රද්ධා චරිත ඇත්තා
• බුද්ධි චරිත ඇත්තා
• විතර්ක චරිත ඇත්තා

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii) •අප ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් විශාලා මහනුවර තුන්බිය දුරුකිරීම පිණිස රතන සූත්‍රය දේශනා කිරීම.
•ගිරිමානන්ද හිමියන්ට ගිරිමානන්ද සූත්‍රය දේශනා කිරීම.
•බොජ්ඣංග ධර්ම දේශනා කිරීම.

මෙම සූත්‍ර දේශනා කළ ආකාරය පැහැදිලි කරන ආකාරය අනුව එක් දේශනාවකට
ලකුණු 2 ½ බැගින් 2 ½ x 2 = ලකුණු 05යි

### 3.5.7 07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.10 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 16.67%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමිවේ.

ඉන්,

0-2 ප්‍රාන්තරයේ 20%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 20%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 40%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 20%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් පිරිස 60%ක් වන අතර, ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 40%කි.



ප්‍රස්තාරය 3.10 (b)

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විතය.

බුදුදහම හා සෞඛ්‍යය යන තේමාවට අදාළ මෙම ප්‍රශ්නයේ (i) හා (ii) කොටස්වල පහසුතාව ඉහළ මට්ටමක පැවතියද (iii) කොටසේ පහසුතාව අඩු මට්ටමක පවතී. එයට හේතුව ලෙස පෙනී යන්නේ එම කොටසට පිළිතුරු ලිවීමේදී, සිසුන්ට විස්තරාත්මකව කරුණු ගොනු කරගෙන ලිවීමේ හැකියාව මද බවය.

මෙවැනි ගැටලු මඟහරවා ගැනීම සඳහා, සිසුන්ගේ චින්තන හැකියාව සහ සන්නිවේදන හැකියා සංවර්ධනය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගැනීමට ගුරුවරයා ක්‍රියාත්මක වීම සුදුසු වේ.

## 8 ප්‍රශ්නය

8. (i) පිරිවෙනක් තුළ සුලභව සිදුවිය හැකි අනතුරු දෙකක් සඳහන් කර එම අනතුරු දෙක වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් බැගින් සඳහන් කරන්න.

*(ලකුණු 02යි)*

(ii) ප්‍රථමාධාර ලබාදෙන්නකු තුළ සංවර්ධනය විය යුතු ගුණාංග තුනක් ලියන්න.

*(ලකුණු 03යි)*

(iii) (අ) පාදයේ වළලුකර සන්ධිය උළුක්කු වීමක දී ඔබ ලබාදෙන ප්‍රථමාධාර ක්‍රමය නම් කරන්න.
(ආ) උළුක්කුවට ප්‍රථමාධාර ලබාදීමේදී ඉහත (අ) හි ඔබ සඳහන් කළ ක්‍රමය අනුපිළිවෙළින් ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරන්න.

*(ලකුණු 05යි)*

**පිළිතුරු**

(i)

- පියගැට පෙළින් ලිස්සීම - පියගැට පෙළවලට අත්වැල් යොදා ආරක්ෂිතව සකස් කිරීම.
- ලිං, පොකුණු ආදිය ළඟ ලිස්සීම - ළිං, පොකුණු ආදියෙහි ආරක්ෂිත වැටක් ඉදිකිරීම සහ ළිඳ දැලකින් වසා තැබීම.
- පොළොවෙහි ලිස්සීම - පොළොව සකස් කිරීමේදී ලිස්සන සුළු පිගන් ගඩොල් භාවිත නොකිරීම.
- සුරතල් සතුන් ඇතිකරන - සුරතල් බල්ලන්, පූසන් වැනි සතුන් නිසිකලට එන්නත් කිරීම අවස්ථාවලදී සතුන් සපාකෑම එම සතුන් නිසි ආකාරයට සුරතල් කිරීම.
- කැඩුනු, බිඳුනු ද්‍රව්‍ය පරිසරය පුරා - කැඩුනු බිඳුනු ද්‍රව්‍ය නිසි ආකාරයට එක් කිරීම.මුදා හැරීම නිසා අනතුරු සිදුවේ සහ පරිසරයට මුදා හැරීමෙන් තැන තැන දැමීමෙන් වැලකීම.

ඉහත අනතුරු හෝ ගැළපෙන එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 02යි

(ii) ප්‍රථමාධාර ලබාදෙන්නකු තුළ සංවර්ධනය විය යුතු ගුණාංග :-

- ප්‍රථමාධාර පිළිබඳ මනා දැනුම, පුහුණුව හා නිපුණතාව
- ස්ථානෝචිත ප්‍රඥාව
- නිවැරදි හා ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව
- කලබල නොවීම හා කාර්යක්ෂම වීම
- නොපසුබට උත්සාහය
- සානුකම්පිත බව හා කාරුණික බව
- ඉවසීම
- කම්පනය නොවීම සහ අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීම
- සුපරීක්ෂාකාරී වීම
- තමා පිළිබඳ ආරක්ෂාව ඇතිකර ගැනීම
- සැමට එකසේ සැලකීම
- නායකත්ව සහ අනුගාමිකත්ව ගුණාංග ඇත්තෙකු වීම

නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 3 = ලකුණු 03යි

(iii) (අ) RICE ක්‍රමය

**නිවැරදි පිළිතුරට ලකුණු 01යි**

(ආ) Rest - වළලුකර සන්ධිය සෙලවීම වලක්වා විවේකය ලබාදීම.

Ice - සිසිල් රඳවනයක් (සීතල පත්තුව) නැතහොත් අයිස් කැට කිහිපයක් රෙදි කැබැල්ලක ඔතා සකසා ගත් සිසිල් රඳවනය මගින් වළලුකර සන්ධිය අවට විටින් විට සිසිල් කිරීම.

Compress - බැන්ඩේජයක් වෙළීම මගින් එම ස්ථානයේ පීඩනයක් ඇති කිරීම.

Elevate - අනතුර සිදුවූ පාදය හදවතට මදක් ඉහළින් ඔසවා තැබීම.


**ඉහත සඳහන් අනුපිළිවෙලට RICE ක්‍රමය විස්තර කොට ඇත්නම් එක් කොටසකට**

**ලකුණු 1 බැගින් 1 x 4 = ලකුණු 04යි**

**එකතුව 1 + 4 = ලකුණු 05යි**

**එකතුව = 2 + 3 + 5 = ලකුණු 10යි**

### 3.5.8 08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.11 (a)

අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 40%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ. ඉන්,

0-2 ප්‍රාන්තරයේ 22%ක් ද,
3-5 ප්‍රාන්තරයේ 56%ක් ද,
6-7 ප්‍රාන්තරයේ 7%ක් ද,
8-10 ප්‍රාන්තරයේ 15%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 22%ක් ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති අතර, අපේක්ෂකයන්ගෙන් 78%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩු සංඛ්‍යාවකි.





ප්‍රස්තාරය 3.11 (b)

මෙම ප්‍රශ්නය කොටස් තුනකි. එම කොටස් අතුරෙන් (i) කොටසේ පහසුතාව 70% ක් වන අතර, (ii) කොටසේ පහසුතාව 75%කි. (iii) වන කොටසෙහි අනුකොටස් 2කි. ඉන් (අ) අනුකොටසේ පහසුතාව 7%ක් වන අතර (ආ) අනුකොටසේ පහසුතාවය 28%කි.

8 වෙනි ප්‍රශ්නයේ (i) සහ (ii) කොටස්වලට පිළිතුරු සැපයීමේදී ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමක පවතින්නේ එම කොටස්වලට සාමාන්‍ය අවබෝධයෙන් යුතුව, පිළිතුරු සැපයිය හැකි බැවින් බව උපකල්පනය කළ හැකිය.

එසේ වුවද (iii) කොටසේ අනුකොටස් දෙකට පිළිතුරු සැපයීමේදී අඩු සාධන මට්ටමක් පෙන්වන්නේ අදාළ විෂය කරුණු නිවැරදිව ග්‍රහණය කිරීමේ අපහසුතාවක් නිසා විය හැකි බව උපකල්පනය කළ හැකිය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




**ප්‍රස්තාරය 3.12**

II ප්‍රශ්න පත්‍රයේ පළමුවන ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. පළමුවන ප්‍රශ්නය මඟින් කෙටි පිළිතුරු සැපයිය හැකි කොටස් 10ක් ඉදිරිපත් කර ඇත.
අනිවාර්ය පළමු ප්‍රශ්නයෙහි පහසුතාව 56%කි. එය අනිවාර්ය වුවද එම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී ඇති අපේක්ෂක පිරිස 97%කි. තෝරාගත යුතු ප්‍රශ්න 7 අතුරෙන් වැඩිම අපේක්ෂකයන් පිරිසක් තෝරාගත් 4 ප්‍රශ්නයෙහි පහසුතාව 61%කි.

තෝරාගත යුතු ප්‍රශ්න 7 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය 3 ප්‍රශ්නයයි. පෞද්ගලික ස්වස්ථතාව හා පරිසර පවිත්‍රතාව පිළිබඳව එම ප්‍රශ්නයෙන් විමසා ඇති අතර, දෛනික ජීවිතය හා බද්ධ වූ මාතෘකාවක් වීම එහි පහසුතාව වැඩි වීමට හේතුවක් වී ඇති බව උපකල්පනය කළ හැකිය.
තෝරාගත යුතු ප්‍රශ්න අතුරෙන් 06 ප්‍රශ්නයෙහි පහසුතාව 45%ක් වුවද එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය අවම වේ. එහි ප්‍රතිශතය 12%කි. ආයුර්වේදය හා බුදුදහම තේමාව යටතේ ඉදිරිපත් වී ඇති මෙම ප්‍රශ්නයෙහි පහසුතාව වැඩි වුවද තෝරාගැනීම අවම වීමට හේතුව වශයෙන් දැක්විය හැක්කේ එම තේමාව අපේක්ෂකයන් අතර ජනප්‍රිය නොවීම විය හැකිය.
තෝරාගතයුතු ප්‍රශ්න අතුරෙන් 07 ප්‍රශ්නය තේරීම 17%ක් තරම් අඩු මට්ටමක පැවතියද එහි පහසුතාව 49%ක් වේ. ඉහළ ශිෂ්‍ය සාධනයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ එම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන්ට බුදු දහම හා සෞඛ්‍ය යන තේමාව පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් තිබීම නිසා බව සිතිය හැකිය. ප්‍රශ්න පත්‍රයේ අග කොටසේ ඇති පහසුතාව වැඩි ප්‍රශ්න තෝරාගැනීම සඳහා අපේක්ෂකයන් නැඹුරු නොවී ප්‍රශ්න පත්‍රයෙහි මුල් ප්‍රශ්න තෝරාගැනීමට යොමුවීමේ ප්‍රවණතාවක් මෙහිදී නිරීක්ෂණය වන බැවින් විභාගය සඳහා ප්‍රශ්න තෝරා ගැනීම පිළිබඳව අපේක්ෂකයන් දැනුවත් කිරීම හා පූර්ව සූදානම් කිරීමේ පෙරහුරු අභ්‍යාස නිරන්තරයෙන් පැවැත්වීමට පරිවේණාචාර්යවරුන් කටයුතු කිරීම මඟින් ශිෂ්‍ය සාධනය වඩාත් සංවර්ධිත මට්ටමක් කරා ළඟා කරගත හැකි වේ.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අවධානය යොමු කළ යුතු කරුණු

1. පළමු පිටුවෙන් අපේක්ෂා කරන තොරතුරු නිවරදිව, පැහැදිලිව සටහන් කළ යුතු ය.

2. ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතුද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේද, කොපමණ ලකුණු ලැබේද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

3. ප්‍රශ්න තෝරාගැනීමේ දී ප්‍රශ්න හොඳින් කියවා, නිරවුල් අවබෝධයක් ඇතිකරගෙන ප්‍රශ්න තෝරා ගැනීම සිදු කළ යුතු ය. මේ සඳහා අමතර කාලය ඵලදායී ලෙස භාවිතා කළ හැකිය.

4. I ප්‍රශ්න පත්‍රයේ, ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරැදි හෝ වඩාත් ගැලපෙන හෝ එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය.

5. I ප්‍රශ්න පත්‍රයේ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ එක් කතිර ලකුණක් (x) පමණක් යෙදිය යුතු ය.

6. II ප්‍රශ්න පත්‍රයේ රචනා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයකටම පිළිතුරු සැපයීම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

7. අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවකටම අදාළ ස්ථානයේ පැහැදිලිව ලිවිය යුතු ය.
8. ප්‍රශ්න අංක හා අනුකොටස් පැහැදිලිව හා නිවැරදිව ලිවිය යුතු ය.

9. නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම, මෙන්ම විස්තරාත්මක පිළිතුර ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී කෙටි පිළි‍ැ ; සැපයීමද නොකළ යුතු ය.

10. ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය නිසි පරිදි කළමණාකරණය කරගැනීමට වග බලාගත යුතු ය.
11. පිළිතුරු ලිවීමේ දී නිල් හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතු ය.

12. නිවැරදි හා පැහැදිලි අත්අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

13. පිළිතුරු පත්‍ර ඇමිණීමේදී පිටු අංක අනුපිළිවෙලට ඇමිණීම සිදු කළ යුතු ය.

## 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- පහසුකම් තිබෙන පරිදි හැකි සෑම විටම නව තාක්ෂණික මෙවලම් භාවිත කරමින් විෂය කරුණු අවබෝධ කරලීමට උත්සහවත් විය යුතු ය.

- ඇතැම් විෂය ඒකක පිළිබඳ ශිෂ්‍ය ප්‍රජාවගේ නිපුණතා සාධනයට උචිත නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිතයට ගුරුභවතුන් නැඹුරු විය යුතු ය.

- කාලීන වැදගත්කමක් සහිත පුද්ගල හා සමාජීය සෞඛ්‍යයට අදාළ කරුණු කෙරෙහි ශිෂ්‍ය ප්‍රජාවගේත් ගුරුභවතුන්ගේත් අවධානය යොමුවිය යුතු ය.

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා ලකුණු දීමේ පටිපාටි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු ය.

- ශිෂ්‍ය ප්‍රජාව වෙනස් වන දැනුමෙන් සන්නද්ධ කිරීමට සම්මන්ත්‍රණ අවස්ථා සංවිධානය කොට දුරාවබෝධ විෂය කරුණු නිරාකරණය කර දීමට අදාළ ගුරුභවතුන් හා පිරිවෙන් ආයතන ප්‍රධානීන් කටයුතු කිරීම සුදුසු ය.

- සෞඛ්‍යවත්ව ජීවත් වීම උදෙසා තේමා පහට අදාළ විෂය කරුණු පිළිබඳ නිරවුල් අවබෝධයක් ඇතිකරලීමට ගුරුභවතුන් යොමු විය යුතු ය.

- ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ඒකක පිළිබඳව නිපුණතා සංවර්ධනයට අවස්ථා සැලසුම් කිරීම හා අවශ්‍ය තන්හි දී බාහිර සම්පත් දායකයන්ගේ, සහය ලබා ගැනීමට ගුරුභවතුන් යොමුවීම සුදුසු ය.

- තර්කානුකූල චින්තනය, නිර්මාණශීලී චින්තනය, මෙන්ම විචාරශීලී චින්තනය උපයෝගී කරගනිමින් පිළිතුරු ලිවීම සඳහා අපේක්ෂකයන් පෙර සූදානම් කළ යුතු ය.

Printed by
Department of Examinations Press